# කැලණිය විශ්වවිද්‍යාලය- ශ්‍රී ලංකාව
# දූරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

## <u>ඩිප්ලෝමා / උසස් ඩිප්ලෝමා ප්‍රදානය කිරීම</u>

කැලණිය විශ්වවිද්‍යාලයේ දූරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රයේ ශාස්ත්‍රවේදී සාමාන්‍ය (බාහිර) උපාධිය හා ව්‍යාපාර කළමනාකරණවේදී සාමාන්‍ය (බාහිර) උපාධිය සඳහා ලියාපදිංචි වී නියමිත කාලසීමාව තුළ උපාධිය සම්පූර්ණ කරගැනීමට නොහැකි වූ විද්‍යාර්ථීන් හට ඩිප්ලෝමා හා උසස් ඩිප්ලෝමා පිරිනැමීමට කැලණිය විශ්වවිද්‍යාලය විසින් තීරණය කර ඇත.

ඒ අනුව අදාළ විද්‍යාර්ථීන් විසින් තමන්ට නියමිත විෂයයන්වලට අදාළව සම්පූර්ණ කර ඇති විෂය සම්භාර (Credits) ප්‍රමාණය අනුව මෙම ඩිප්ලෝමා හා උසස් ඩිප්ලෝමා ප්‍රදානය සිදුකිරීමට නියමිත අතර විෂය සම්භාර 30 ක් සම්පූර්ණ කර ඇති විද්‍යාර්ථීන් හට ඩිප්ලෝමාව (SLQF Level 03) හා විෂය සම්භාර 60 ක් සම්පූර්ණ කර ඇති විද්‍යාර්ථීන් හට උසස් ඩිප්ලෝමාව (SLQF Level 04) පිරිනැමීමට නියමිතය.

මේ සඳහා ඉල්ලුම් කිරීමට මූලික සුදුසුකම් සපුරා ඇති අපේක්ෂකයින්ගේ නාමලේඛනය අප වෙබ් අඩවියේ (www.cdce.kln.ac.lk) මේ වන විට පළකර ඇති අතර වෙබ් අඩවියට පිවිස බාගත කරගත් අයදුම්පත නිසි ලෙස සම්පූර්ණ කර මහජන බැංකුවේ ඕනෑම ශාඛාවකට රු. 1000/- ක මුදලක් ගෙවා බැංකුව විසින් ලබාදෙන රිසිට්පත සමග **"නියෝජ්‍ය ලේඛකාධිකාරී, දූරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය, අංක. 56/6, කෝන්ගහවත්ත පාර, නුවර පාර, කිරිබත්ගොඩ."** යන ලිපිනයට **2025 සැප්තැම්බර් මස 25** දිනට පෙර ලියාපදිංචි තැපෑලෙන් යොමු කිරීමෙන් මේ සඳහා අයදුම් කළ හැකි වේ.

එසේ අයදුම් කරන අපේක්ෂකයින් අතරින් ඩිප්ලෝමා ප්‍රදානෝත්සවය සඳහා තෝරාගනු ලබන අපේක්ෂකයින්ගේ නාම ලේඛනය හා ඩිප්ලෝමා ප්‍රදානෝත්සවයට අදාළ සියලු තොරතුරු අප වෙබ් අඩවිය හරහා ඉදිරියේදී දැනුම් දීමට කටයුතු කරනු ලැබේ.

ලේඛකාධිකාරී
කැලණිය විශ්වවිද්‍යාලය
2025.08.17